


# මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඇතුළත් විශේෂ කරුණු

## 2025 පෙබරවාරි

2025 පෙබරවාරි 14

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# නෛතික අවශ්‍යතාවය

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 27 සහ 80 යන වගන්තිවලට අනුකූලව, සමාලෝචනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා පදනම් වූ කරුණු සමඟ උද්ධමනය සහ ආර්ථික වර්ධන ඉදිරි දැක්ම පිළිබඳ මග පෙන්වීමක්, සහ ඉදිරි දැක්ම සඳහා ඇති අවදානම් පිළිබඳ ඇගයීමක් මහජනතාවට සහ ආර්ථිකයේ අනෙකුත් පාර්ශ්වකරුවන්ට සන්නිවේදනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව සකස් කරනු ලබයි

# මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ අරමුණ...

- විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති තීරණයෙහි පදනම සන්නිවේදනය කිරීම
- වගවීම ඉහළ නැංවීම සහ මුදල් ප්‍රතිපත්තියේ විශ්වසනීයත්වය ගොඩනැගීම
- මූල්‍ය වෙළඳපොළ සහ සියලුම පාර්ශ්වකරුවන් සඳහා මාර්ගෝපදේශ සැපයීම
- උද්ධමන අපේක්ෂා පාලනය කිරීම
- ප්‍රතිපත්ති සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම

# මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඇතුළත් වන්නේ

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව
- මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සාරාංශය
- මුදල් ප්‍රතිපත්ති සාරාංශය
- උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම
  - මූලික පුරෝකථන
  - පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන
  - උද්ධමනය සහ ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්
  - පෙර පුරෝකථන සමඟ සැසඳීම
- වර්තමාන ආර්ථික තත්ත්වය
  - දේශීය ආර්ථිකයේ විවිධ අංශවල සහ ගෝලීය ප්‍රවණතා

*මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රධාන ඉලක්ක*

*මීට අමතරව, විශේෂ සටහන්*

*"උද්ධමන ව්‍යාප්ති සටහන පිළිබඳ හැඳින්වීමක්"*

*"ශ්‍රී ලංකාවේ වත්මන් අවධමන තත්ත්වයට බලපාන මිල ප්‍රවණතා සහ මහජන අදහස්"*




# මුදල් ප්‍රතිපත්ති සාරාංශය

# ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය...

## *පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ සිට*

### 2024 සැප්තැම්බර්

ප්‍රතිපත්ති පොලී අනුපාතික 8.25% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.25% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) යන මට්ටමේ **නොවෙනස්ව පවත්වාගෙන යන ලදී.**

### 2024 නොවැම්බර්

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට මහ බැංකුව යොමු විය.

**එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දෙන ලදී.**

**පදනම් අංක 50කින් පමණ අඩු කිරීමක් සමඟ** එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස තීරණය කළේය.

### 2025 ජනවාරි

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00% මට්ටමේ **නොවෙනස්ව පවත්වාගෙන යන ලදී.**

**එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ නිත්‍ය පහසුකම් අනුපාතික**




**"2024 නොවැම්බර් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය තවදුරටත් අඩු කරමින් මහ බැංකුව 2024 වසර මුළුල්ලේ සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන ගියේය"**




# වත්මන් උද්ධමන ප්‍රවණතා සහ ඉදිරි දැක්ම

# 2024 වසරේ දෙවන භාගයේ දී මතුපිට උද්ධමනය පහළ ගිය අතර සැප්තැම්බර් මාසයේ සිට සෘණ අගයක පැවතුණි...

මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)




මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

සැලකිය යුතු විදුලි ගාස්තු අඩු කිරීම් අවධමන තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය

ඉන්ධන සහ එල්.පී ගෑස් මිල ගණන් පහළ දැමීම, ජල ගාස්තු අඩු කිරීම සහ ආහාර මිල ගණන් අඩු වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය

# නුදුරු කාලීනව මතුපිට උද්ධමනය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර මැදි කාලීනව **5%**ක ඉලක්කගත මට්ටම වටා ස්ථායි වනු ඇත...

මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය,%)
2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව




- අවධමන තත්ත්ව නුදුරු කාලීනව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
- 2025 වසරේ අග භාගය සහ 2026 වසරේ මැද භාගය අතර කාලය තුළ උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා ඉහළ යා හැකි වුවත් එම ප්‍රවණතාව තාවකාලික වනු ඇතැයි පුරෝකථන කෙරේ

**සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහායයෙන් උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත 5% මට්ටමට ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ**

**සටහන :** මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. 2025 ජනවාරි පුරෝකථන වාරයේ පුරෝකථන එම සියලුම ප්‍රකාශිත දත්ත මත පදනම් වේ.

# මූලික උද්ධමන පුරෝකථන අඩු උච්චාවචනයක් පිළිබිඹු කරයි...




- 2024 වසරේ ජනවාරි මාසයේ දී ක්‍රියාත්මක වූ එකතු කළ අගය මත බදු සංශෝධන නිසා ඇති වූ පදනම් බලපෑම හේතුවෙන් නුදුරු කාලීනව මූලික උද්ධමනයේ තාවකාලික පහළ යෑමක් අපේක්ෂා කෙරේ

- නමුත්, ඉන්පසුව මූලික උද්ධමනය, අඩු උච්චාවචනයක් සහිතව මතුපිට උද්ධමනයේ ඉලක්කයට අනුකූලව යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ

**සටහන :** මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. 2025 ජනවාරි පුරෝකථන වාරයේ පුරෝකථන එම සියලුම ප්‍රකාශිත දත්ත මත පදනම් වේ.

# උද්ධමන පුරෝකථන මත පවතින අවදානම්...

## උද්ධමනය පුරෝකථන මට්ටමට වඩා ඉහළ යෑමේ අවදානම්

- ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම
- අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව
- සැලකිය යුතු මට්ටමකින් රුපියල අවප්‍රමාණය වීමට ඇති හැකියාව
- භූ-දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල කෙරෙහි ඇති විය හැකි ඉහළ පීඩන

## උද්ධමනය පුරෝකථන මට්ටමට වඩා පහළ යෑමේ අවදානම්

- බලශක්ති මිල අඩුකිරීම් නිසා ඇති විය හැකි වක්‍ර බලපෑම්
- අත්‍යවශ්‍ය භාණ්ඩවල සිදු විය හැකි මිල අඩු කිරීම්
- මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම




# ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම

# මැදි කාලීනව ආර්ථික වර්ධනය අඩු වේගයකින් වුවද, අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ...

කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව




ආර්ථික වර්ධනයට අදාළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නොමැතිව, දැනට පවතින තොරතුරු මත පදනම්වූ පුරෝකථන අනුව, ආර්ථිකය මැදි කාලීනව එහි සම්පූර්ණ ධාරිතා මට්ටමට වඩා අඩුවෙන් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

සටහන : මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

# ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම මත පවතින අවදානම්...

## ආර්ථික වර්ධනය පුරෝකථන මට්ටමට වඩා පහළ යෑමේ අවදානම්

- බුද්ධි ගලනය හේතුවෙන් ඇතිවිය හැකි ශ්‍රම හිඟය සහ ඵලදායීතාව අඩු වීම
- කාලගුණික විපර්යාස සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට සිදුවන අහිතකර බලපෑම
- එක්සත් ජනපදයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් මධ්‍යයේ වන ගෝලීය අවිනිශ්චිතතා හේතුවෙන් විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයට ඇති විය හැකි බලපෑම්

## ආර්ථික වර්ධනය පුරෝකථන මට්ටමට වඩා ඉහළ යෑමේ අවදානම්

- ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමේ බලපෑම
- ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් නව ප්‍රතිපත්ති හඳුන්වාදීම
- සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් විය හැකි වක්‍ර බලපෑම්


75 YEARS
STABILITY FOR PROSPERITY
මුදල් ප්‍රතිපත්ති වාර්තාව
2025 පෙබරවාරි
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# විශේෂ සටහන්

# විශේෂ සටහන (අ):උද්ධමන ව්‍යාප්ති සටහන පිළිබඳ හැඳින්වීමක්...

**උද්ධමන ව්‍යාප්ති සටහන යනු පුරෝකථනය හා සම්බන්ධ අවිනිශ්චිතතා විදහා දක්වමින් උද්ධමන පුරෝකථන සන්නිවේදනය කිරීමේ ක්‍රමයකි**

උද්ධමන ව්‍යාප්ති සටහනක අඩංගු වන්නේ මොනවාද:

- මෑත කාලයේ දී වාර්තා වූ දත්ත
- විශ්‍රම්භ පරාස
  - *...පුරෝකථන කාල සීමාව තුළ උද්ධමනයේ පැවතිය හැකි අගය පරාසයන් පෙන්නුම් කරයි*

## උද්ධමන ව්‍යාප්ති සටහනක ප්‍රධාන සංරචක

මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)

*2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව*



# විශේෂ සටහන (ආ): ශ්‍රී ලංකාවේ වත්මන් අවධමන තත්ත්වයට බලපාන මිල ප්‍රවණතා සහ මහජන අදහස්...

2024 වසරේ ජනවාරි මස සිට 2025 වසරේ ජනවාරි මස දක්වා ගෘහ ඒකක වියදම පහළ යෑමට දායකත්වය (කො.පා.මි.ද මත පදනම් වූ, රු.)




**"පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සංසන්දනය කිරීමේ දී, පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබන ආර්ථිකයේ සමස්ත මිල මට්ටමේ පහළ යෑම, අවධමනය මගින් නිරූපණය වේ"**

පසුගිය මාස කිහිපය තුළ අවධමන තත්ත්වයක් පැවතිය ද, එය ජීවන වියදමේ සහනයක් ලෙස පිළිබිඹු නොවන බව ඇතැම් කොටස් පවසන්නේ ඇයි ?

- දැනටමත් ඉහළ ගොස් ඇති මිල මට්ටම්
- බොහෝ ආදායම් මට්ටම්, අතීත උද්ධමනකාරී තත්ත්වයන්හි බලපෑමට සාපේක්ෂව පූර්ණ ලෙස ගැළපී නොතිබීම
- පුද්ගල අදහස් සහ චර්යා රටාවල ස්වභාවය
- උද්ධමනය යන ආර්ථික  සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිවීම


75 YEARS
STABILITY FOR PROSPERITY
මුදල් ප්‍රතිපත්ති වාර්තාව
2025 පෙබරවාරි
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ස්තූතියි